අධ්‍යාපන අමාත්‍යාංශය

<u>දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු හා උතුරු හා නැගෙනහිර පළාත් සඳහා තොරතුරු තාක්ෂණය, ගෘහ විද්‍යාව, සෞන්දර්ය විෂයයන් (චිත්‍ර, සංගීත, නර්තනය) සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I(ඇ) ශ්‍රේණියට බඳවා ගැනීම-2021</u>

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු හා උතුරු හා නැගෙනහිර පළාත් සඳහා තොරතුරු තාක්ෂණය, ගෘහ විද්‍යාව, සෞන්දර්ය විෂයන්හි (චිත්‍ර, සංගීත, නර්තනය) පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තිය I(ඇ) ශ්‍රේණියට ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ .මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2021.03.19 දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.(ඉදිරියේදී මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්පත් කැඳවීමට බලාපොරොත්තු වන බැවින් ඒ සඳහා පිවිසුම නුදුරේම ප්‍රසිද්ධ කරනු ලැබේ.) තව ද විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු හා උතුරු හා නැගෙනහිර පළාත් සඳහා තොරතුරු තාක්ෂණය, ගෘහ විද්‍යාව ,සෞන්දර්ය විෂයයන් (චිත්‍ර, සංගීත, නර්තනය) සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1(ඇ) ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2021" ලෙස අනිවාර්යයෙන් සඳහන් කල යුතුය.

සටහන 1:- අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි ප්‍රතිවිපාක අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. එමෙන්ම අයදුම්පත් ලැබී ඇති බව දන්වනු නොලැබේ.

02. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:

2.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිට, එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාව අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් (05) ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් ගුරු වෘත්තියේ දී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව කුසලතාව මැන බැලීම සඳහා මෙම ගැසට් නිවේදනයේ 13.2 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව අයදුම්කරු විසින් ප්‍රායෝගික පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රමුඛතාව මත පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

2.3 ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේ දී අයදුම්කරුවන්ට අදාළ පුරප්පාඩු ලේඛනය ප්‍රදර්ශනය කරනු ලැබේ. ඒ අනුව අයදුම්කරුවන් විසින් එම අවස්ථාවේ දී පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්වකීය පත්වීම් ලබා ගැනීමට ඇති මනාපය අනුපිළිවෙලින් දැක්විය යුතුය.

2.4 මෙම පුරප්පාඩු සඳහා බඳවාගනු ලබන්නේ පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන වන බැවින් වසර 08 ක් ගත වනතුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ. මෙම වසර 08 තුළ පත්වීම්ලාභීන් සඳහා මාරුවීම් අයදුම් කළ නොහැකි අතර යම් හෙයකින් ගුරු මාරුවක් සඳහා අයදුම් කළ තැනැත්තෙකු වේ නම් ඔහුගේ /ඇයගේ පත්වීම අහෝසි කිරීම සිදු වේ.

2.5. **පවතින පුරප්පාඩු**

පළාත	ඉංග්‍රීසි මාධ්‍ය		සිංහල මාධ්‍යය				දෙමළ මාධ්‍යය			
	ඉංග්‍රීසි	කොරතුරු තාක්ෂණය	ගණිතය විද්‍යාව	සංගීත	නැටුම්	චිත්‍ර	ගණිතය විද්‍යාව	සංගීත	නැටුම්	චිත්‍ර
බස්නාහිර	√	-	-	-	-	-	-	-	-	-
මධ්‍යම	√	-	-	-	-	-	-	-	-	-
දකුණ	√	-	-	-	-	-	-	-	-	-
උතුර	√	√	√	√	√	√	√	√	√	√
නැගෙනහිර	√	√	√	√	√	√	√	√	√	√
වයඹ	√	-	-	-	-	-	-	-	-	-
උතුරු මැද	√	-	-	-	-	-	-	-	-	-
සබරගමුව	√	-	-	-	-	-	-	-	-	-
ඌව	√	-	-	-	-	-	-	-	-	-

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාව ලබා ගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද , දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

v. 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට ද, එම සේවා ව්‍යවස්ථාවට මින් මතුවට සිදුකරනු ලබන සංශෝධනයන්ට ද රාජ්‍ය සේවයේ පත්වීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වනු ඇත.

04. වැටුප් පරිමාණය:

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව G-E-01-2016 හි රු.27, 740-300x6-380x7-445x2-රු.33,090/-(මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.පත්වීම්ලාභීන් මෙම වැටුප් පරිමාණයේ 7 වන වැටුප් පියවර වන රු. 29,540/- වැටුපෙහි පිහිටුවනු ලැබේ. වැටුප් ගෙවීම සිදු කරනු ලබන්නේ එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් විධිවිධාන අනුව වේ.මෙයට අමතරව රජයේ නිලධරයින් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද ඔබට හිමිය.

05. අධ්‍යාපන සුදුසුකම් :

5.1 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2021.03.19 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5.2 අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන ආයතනයක් විසින් පිරිනමනු ලබන දෙවසරකට නොඅඩු කාල පරාසයක් සහිත වූද , ජාතික වෘත්තීය කුසලතා මට්ටම හය (6) ට නොඅඩු තරාතිරමක ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා සම්පූර්ණ කර තිබිය යුතුය.

5.3 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතුය.

සටහන 2 : විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ.) විභාගය හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

06. වයස් සීමාව:-

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබිය යුතු අතර, එදිනට වයස අවුරුදු 35 නොඉක්මවිය යුතුය
("ඒ අනුව 2003.03.19 දිනට හෝ ඊට පෙර හා 1986.03.19 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත")

07. අනෙකුත් අවශ්‍යතා :

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

08. අයදුම්කිරීමේ ක්‍රමය:

8.1 අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් සකස් කර අයදුම්කරු විසින්ම පිරවිය යුතුය. 1.0 සිට 3.5 තෙක් වන ශීර්ෂ පළමුවන පිටුවේද 3.6 සිට ශීර්ෂ අනිකුත් පිටු වලට ද ඇතුළත් වන පරිදි විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන්ම තම අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් ද අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) එබැවින් තොරතුරු නිවැරදිව ඇතුලත් කොට සම්පූර්ණ කරනු ලබන අයදුම්පත ගැසට් නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳවත්, නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇත් ද යන්න පිළිබඳවත් අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ.

8.2 විභාග පරිපාටිය

i. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් කොළඹ **දී** පැවැත් වේ.

ii. සෑම අයදුම්කරුවෙකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ, එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට නියමිත භාෂා මාධ්‍යම විය යුතුය.

iii. අයදුම්කරුවකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

iv. විභාගය ප්‍රශ්න පත්‍ර දෙක (02)කින් සමන්විත වේ. සෑම අයදුම්කරුවකුම ප්‍රශ්න පත්‍ර දෙක (02)ටම පෙනී සිටිය යුතුය. සාමාර්ථ්‍ය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගැනීම අනිවාර්ය වේ.

v. බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධරියා විසින් තීරණය කරනු ලැබේ.

8.3 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි**.**

8.4 අයදුම්පතෙහි ද විභාගය සඳහා වන ප්‍රවේශ පතෙහි ද අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු / සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/ පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු, රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.5 විභාග ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශපත නොලද අයදුම්කරුවකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පතෙහි පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් 011-2784232 දරන ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ලඟ තබා ගත් අයදුම්පතෙහි පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/ විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

09. විභාගයට පෙනී සිටීම :

9.1 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැ'යි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත් නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශපත ඉදිරිපත් කොට විභාගයට පෙනී සිටිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2 අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය.

9.3 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

සටහන 03 : අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් දැරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලබන අතර විභාගය සමත්වීම පත්වීම් ලැබීමට සුදුසුකමක් ලෙස සළකනු නොලැබේ.

10. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් එක් අනන්‍යතා පතක් ඉදිරිපත් කල යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(iii)මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ වලංගු රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය.එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ.තව ද විභාග ශාලාවට ඇතුළත් වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග නිළධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරුවන් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ.

12. විෂය නිර්දේශය

සියලුම අයදුම්කරුවන් ලිඛිත විභාගයේ ප්‍රශ්න පත්‍ර දෙක සඳහා පෙනී සිටීම අනිවාර්යය වේ.

i. අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 01යි. (ලකුණු 100)
අපේක්ෂකයා සතු ගුරු වෘත්තීය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතුය.

ii. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි. (ලකුණු 100 යි)
ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා/ හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනීම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතු වේ.

13. සම්මුඛ පරීක්ෂණය

13.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

සටහන 4 : ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු -

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැ'යි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

13.2 **ප්‍රායෝගික පරීක්ෂණය**

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

අනු අංකය	ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක	උපරිම ලකුණු ප්‍රමාණය	සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
01	අරමුණ හා ප්‍රවිශ්ට වීම	05	02
02	පෞරුෂය හා හඬ පාලනය	05	02
03	සන්නිවේදනයේ පැහැදිලි බව	05	02
04	කාල කළමනාකරණය	05	02
05	ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය	05	02
	මුළු ලකුණු ප්‍රමාණය	25	10

සටහන 5 :- ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු -
ගුරු වෘත්තියේදී වැදගත්වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම.

13.2.1 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය

(i) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි පහ (05)කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
(ii) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.

(iii) ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 02 බැගින් ලබා ගත යුතුය.
(iv) ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

13.2.2 නිර්ණායකයන් හි අරමුණු

(i) අරමුණ හා ප්‍රවිශ්ට වීම.
සාර්ථකව පාඩමෙ හි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.
(ii) පෞරුෂය හා හඬ පාලනය
ගුරුවරයකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමට ඇති හැකියාව ඇගයීම.
(iii) සන්නිවේදනයේ පැහැදිලි බව
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.
(iv)කාල කළමනාකරණය
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ලඟා වීමේ කුසලතාවය ඇගයීම.
(v)ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය
අරමුණ කෙරෙහි ලඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම.

14. විභාග ගාස්තු

14.1 විභාග ගාස්තුව රු.600/- කි. ආදායම් ශීර්ෂ අංක 20-03-02-13 යටතේ විභාග කොමසාරිස් ජනරාල් නමින් ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා අයදුම්කරුගේම නමට ලබා ලන්නා ලද ලදුපත අයදුම්පතේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කරන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

15. විභාග ප්‍රතිඵල

ලිඛිත විභාගයට පෙනී සිට විභාගය සමත් සියලුම අයදුම්කරුවන්ගේ මුලු ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.result.exam.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

16. අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :

අයදුම්පත පිරවීමේදී පහත උප ලේඛන (01,02,03) පමණක් භාවිතා කරන්න.

<u>උප ලේඛනය 01</u>

භාෂා මාධ්‍යය	කේත අංකය
සිංහල මාධ්‍යය	2
දෙමළ මාධ්‍යය	3
ඉංග්‍රීසි	4

<u>උප ලේඛනය 02</u>

දිස්ත්‍රික්කය	කේත අංකය
කොළඹ	1
ගම්පහ	2
කළුතර	3
මහනුවර	4
මාතලේ	5
නුවරඑළිය	6
ගාල්ල	7
මාතර	8
හම්බන්තොට	9
යාපනය	10
මන්නාරම	11
වවුනියාව	12
මුලතිව්	13
කිලිනාච්චිය	14
මඩකලපුව	15
අම්පාර	16
ත්‍රිකුණාමලය	17
කුරුණෑගල	18
පුත්තලම	19
අනුරාධපුරය	20
පොළොන්නරුව	21
බදුල්ල	22
මොණරාගල	23
රත්නපුරය	24
කෑගල්ල	25

<u>උප ලේඛනය 03</u>

විෂයය	**කේත අංකය**
තොරතුරු තාක්ෂණය	**1**
ගෘහ විද්‍යාව	**2**
සංගීතය	**3**
චිත්‍ර	**4**
නර්තනය	**5**
ඉංග්‍රීසි	**6**

17. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ අංක 9.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

18. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

19. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

20. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතුවේ.

21. සිංහල, දෙමළ හා ඉංග්‍රිසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
පැලවත්ත, බත්තරමුල්ල.
2021. ..... වැනි දින

ආදර්ශ අයදුම්පත

අධ්‍යාපන අමාත්‍යාංශය (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු හා උතුරු හා නැගෙනහිර පළාත් සඳහා තොරතුරු තාක්ෂණය, ගෘහ විද්‍යාව, සෞන්දර්ය විෂයයන් (චිත්‍ර, සංගීත, නර්තනය) සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I(ඇ) ශ්‍රේණියට බඳවා ගැනීම-2021

Open Competitive Examination For the recruitment to Grade 3-I (C) of Sri Lanka Teachers' Service for English teacher vacancies in National and Provincial Schools and for the vacancies in Information Technology, Home Science and Aesthetic Subjects (Arts, Music, Dancing) in Northern and Eastern Provinces - 2021

1.0

1.1පුරප්පාඩුව සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය සඳහා උපලේඛන **0**1 භාවිතා කර කේත අංකය යොදන්න.

භාෂා මාධ්‍යය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.2 පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරනු ලබන දිස්ත්‍රික්කය සඳහා උපලේඛන 02 භාවිතා කර අදාළ කේත අංකය යොදන්න.

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.3 ඉල්ලුම් කරනු ලබන විෂයය සඳහා උපලේඛන 03 භාවිතා කර අදාළ කේත අංකය යොදන්න

(අදාළ අංකය කොටුව තුළ ලියන්න

2.0

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා:-AMRAKOON MUDIYANSELAGE NAMAL HERATH)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (උදා:- HERATH A.M.N.)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) ----------

3.0. වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ----------
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

3.1 ජාතික හැඳුනුම්පත් අංකය

3.3 ස්ථාවර දුරකථන අංකය

3.4 ජංගම්දුරකථන අංකය

3.5 විවාහක/අවිවාහක බව : අවිවාහක-1 විවාහක-2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.6 උපන් දිනය : ☐☐☐☐ වර්ෂය ☐☐ මාසය ☐☐ දිනය

3.7 2021..... දිනට වයස: ☐☐ අවු: ☐☐ මාස: ☐☐ දින:

4.0 ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී-1 පුරුෂ-0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

5.0 අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර

අ.පො.ස.(සා.පෙළ) විභාගය				අ.පො.ස.(උ.පෙළ) විභාගය	
වර්ෂය		විභාග අංකය		වර්ෂය	විභාග අංකය .....
විෂයය	සාමර්ථය	විෂයය	සාමර්ථය	විෂයය	සාමර්ථය
1		6		1	
2		7		2	
3		8		3	
4		9		4	
5		10			

6. 0 ලබා ඇති ඩිප්ලෝමාව පිළිබඳ විස්තර :

6.1 ලබා ඇති ඩිප්ලෝමාව :-
6.2 නිකුත් කළ ආයතනය :-
6.3 ඩිප්ලෝමා සහතිකය වලංගු දිනය : -
6.4 ඩිප්ලෝමාව සඳහා හදාරා ඇති ප්‍රධාන විෂයය/ විෂයයන් : -
6.5 ඩිප්ලෝමාව හදාරා ඇති මාධ්‍යය :-
6.6 ඩිප්ලෝමා පාඨමාලාවේ කාල පරාසය :-

7.0 විභාග ගාස්තු ගෙවීම පිළිබඳ විස්තර:

7.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :.....
7.2 කුවිතාන්සියේ අංකය: :.....
7.3 නිකුත් කළ තැපැල්/උප තැපැල් කාර්යාලය:- :.....
7.4 දිනය:- :.....

මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න. මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව මෙම තොරතුරු අසත්‍ය බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

....
දිනය අයදුම්කරුගේ අත්සන

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .....මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ..... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

දිනය අත්සන සහතික කරන නිලධාරීගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම .....
තනතුර .....
ලිපිනය .....
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

9.0 අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

.....මහතා / මහත්මිය/ මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථීර/තාවකාලික/අනියම් සේවකයකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

.....
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන

දිනය .....
තනතුර .....
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව .....
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)